# භාෂාව, සන්නිවේදනය හා එහි භාවිතය පිළිබඳ බෞද්ධ ස්ථාවරය

අමිල කලුආරච්චි

Language is one of the primary factors related to the evolution of human beings. It has been highly significant in their culture as well. It is with the help of language that the ideas created in the human mind are expressed. Language is the medium of human communication. Language is an instrument which should be appropriately managed. Though language is an advantage for human beings, it can turn into a cause for various difficulties, oppressions, conflicts and problems faced by them. Therefore, human beings must have a wide philosophy and a clear understanding on how to use their language. The applicability of Buddhist teaching on language in creating a humanistic philosophy is of paramount importance.

© අමිල කලුආරච්චි

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර, දිනේෂ් සඳරුවන්
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

අන්තර්පුද්ගල සම්බන්ධතා සංවර්ධනය කිරීමෙහි ලා ලෞකික වශයෙන් සන්නිවේදනය උපයෝගී කරගත හැකි අතර එහි ආගමික භාවිත වන්නේ සාම්ප්‍රදායික හා බුද්ධිවාදී ඥාන විභාගයෙන් රැස් කරගන්නා දැනුම සමාජගත කිරීම යි. මෙහි ලා ආනුභූතික ඥානය බාහිර සමාජයට ප්‍රකාශ කිරීමේ උපකරණයක් වශයෙන් භාෂාව යොදාගැනෙන අතර සංකේතානුසාරයෙන් ද තත් භාෂාව ම ශබ්ද, සංකේත නොමැති ව රූප සඤ්ඤානුසාරයෙන් ද වහනය කෙරේ. නූතන සන්නිවේදන මූල ධර්ම පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ඒවායෙහි අවශ්‍යතාව, පරමාර්ථ, පරමාර්ථ සාධනයෙහි ක්‍රමවේද හා අහිතකර තත්ත්ව (disadvatages) ආදිය ගැඹුරින් සාකච්ඡාවට භාජන වන පොදු මූල ධර්ම වශයෙන් හඳුනාගත හැකි ය. බුදු දහමේ භාෂාව ප්‍රාමාණික සාධකයක් නො වන නමුත් යම් ප්‍රමාණයකට සම්මුතිමය තත්ත්වයක් ආරෝපණය කළ බවක් දක්නට ලැබේ. බුදු රජාණන් වහන්සේ තම බුද්ධත්වයෙන් අනතුරු ව ධර්මය දේශනා නො කිරීමට ගත් තීරණයෙහි[1] අවාච්‍යාර්ථය වන්නේ උන් වහන්සේ අවබෝධ කරගත් ඥානය බාහිරට ප්‍රකාශ කිරීමට තරම් භාෂාව ප්‍රමාණවත් නො වූ බව යි.

බුදු රජාණන් වහන්සේගේ අනුභූතිය, ඉන්ද්‍රියානුභූතිය ද ඉක්මවූ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් ප්‍රත්‍යක්ෂ කළ ඥාන සාධනයකි. තත් ඥාන සාධනය වචනයෙන් කිව නො හැකි (අනිර්වචනීය) තත්ත්වයක් වන අතර එය පැහැදිලි කිරීම සඳහා ලෞකික ලෝකයේ පරිභාවිත වාක්කෝෂය හැකි උපරිමයෙන් යොදාගැනීමට උන් වහන්සේ උත්සුක වූ සේක. බුද්ධ චරිතයෙහි පමණක් නො ව උන් වහන්සේගේ ප්‍රධාන ශ්‍රාවක ශ්‍රාවිකාවන් අතර ද භාෂාව පිළිබඳ විවිධ ආකල්ප පැවැති බවත් භාෂාවේ නිපුණතාව ඔවුනොවුන්ගේ සමාජ පෙළහර සඳහා අතිශය වැදගත් වූ බවත් හඳුනාගත හැකි ය. එනිසා භාෂාවත්, සන්නිවේදනයත් එහි දර්ශනයත් යන අංශ බුද්ධ දේශනා කෙරෙන් පෝෂණය වී ඇත්තේ කෙසේ දැ යි පිරික්සීම අධ්‍යාපනයේ සර්ව කාලීන හා සර්ව භෞමික උන්නතිය විෂයයෙහි මහෝපකාරී වේ. මේ ලිපිය ඒ සඳහා එක්තරා ප්‍රයත්නයකි.

භාෂාව යනු වර්ෂ පන් දහසකටත් එහා ගිය අතීතයක් ඇති උපකරණයකි. සඤ්ඤාමය වශයෙන් මූලික අවධියේ දී භාෂාව යොදාගත් අතර පසු කාලීන ව ගස්වල පත් ඉරු, කොළ ආදිය යොදාගනිමින් රූපාක්ෂර භාවිත කිරීමත් ක්‍රමානුකූල ව තත් රූපාක්ෂර දියුණු වීමත් සමඟ භාෂාව ක්‍රමික ව සංවර්ධනය වූ බවක් දක්නට ඇත. වෛදික යුගය වන විට රචනා ස්වරූපයෙන් භාවිත නො වූ භාෂාව වාචික ව විවිධතා සහිත ව ව්‍යවහාර වූ බවට සාධක වේ. භාෂාවේ භාවිත වන සංකේත, පද සම්මුති වන අතර පරමාර්ථ සත්‍යයක් ප්‍රකාශ කිරීමේ දී තත් සම්මුතිවල ප්‍රාමාණිකභාවය පිළිබඳ ගැටලු මතු වෙයි. බුදු රජාණන් වහන්සේ සන්නිවේදනය සඳහා භාෂාව පමණක් භාවිත නො කළ අතර භාෂාවෙන් ප්‍රකාශ කළ නො හැකි ඇතැම් කරුණු රූප මාධ්‍යයෙන් ද අවාචික ව ද තුෂ්ණිම්භූතභාවයෙන් ද ප්‍රකට කළ සේක. සාම්ප්‍රදායික පිළිගැනීම වන්නේ බුදු රජාණන් වහන්සේ භාෂා හැට හතරක දක්ෂතා දැක්වූ ශිෂ්‍යයකු වූ බව යි. උන් වහන්සේ තම ධර්ම දේශනාවල යොදාගත හැකි උපරිම භාෂා භාවිතය යොදාගනිමින් අවබෝධ කරගත් සත්‍යයට නිශ්චිත ස්වරූපයක් ලබාදීම සඳහා උත්සාහ කළ සේක. භික්ෂූන් වහන්සේලාට ප්‍රථම අවබෝධය ලබාදුන් බුදු රජාණන් වහන්සේ පැහැදිලි කර සිටියේ තම ධර්මය අර්ථ, ව්‍යඤ්ජන සහිත ව දේශනා කරන ලෙස යි.[2] ඒ සන්නිවේදන අරමුණු කොතෙක් ව්‍යාප්ත ව පැවැතියේ ද යත් 'කේවලපරිපුණ්ණං' යන වචනයෙන් ම පැහැදිලි කරගත හැකි ය. එයින් නිගමනය කළ හැක්කේ උන් වහන්සේ භාෂාව හැකි උපරිමයෙන් පරිපූර්ණ ව භාවිත කිරීමට උත්සාහ කළ බව යි. මෙහි ලා උන් වහන්සේගේ ප්‍රධාන මාධ්‍ය දෙකක් භාෂාව විෂයයෙහි එල්ල විය. ඒවා වූයේ අර්ථය හා ව්‍යඤ්ජනය යි. අර්ථ යනු පදවලින් ගම්‍ය වන වාක් අර්ථය යි. ව්‍යඤ්ජන යනු පද සහ වාක්‍ය ඉක්මවූ ගම්‍යාර්ථ ය. එනම් ව්‍යඤ්ජන හෙවත් පද රාශියකින් මතු වන වෙනත් අදහසක් ඉන් ගම්‍ය වෙයි. සිංහල භාෂාවේ වර්තමානයේ භාවිත වන 'ඇණය' යන පදයට සමාජ ගත විවිධ අර්ථකථන හඳුනාගත හැකි වෙයි. නමුත් මතු පිට ස්වරූපය 'ඇණය' යනුවෙන් ම දකින්නට ඇති අතර ව්‍යඤ්ජනාර්ථ විවිධත්වයෙන් හඳුනාගත හැකි ය. තත් විවිධත්වය අවබෝධ නො කරගන්නා පුද්ගලයා ඒ ඒ සන්දර්භයෙහි භාවිත වන ඇණය යන වචනය නිසි

ලෙස අවබෝධ නො කරගනියි. සන්නිවේදනය සම්පූර්ණයෙන් සාර්ථක වීමට නම් පද ඉක්මවා ගිය ව්‍යඤ්ජන පිළිබඳ සවිඤ්ඤානිකත්වයක් අත්‍යවශ්‍ය ය. බුදු රජාණන් වහන්සේ සතු ව තත් ලක්ෂණ පැවැතියා මෙන් ම උන් වහන්සේගේ ශිෂ්‍යයන්හට ද තත් හැකියා උපයෝගී කරගන්නා ලෙස පැවැසුවේ මේ අර්ථ හා ව්‍යඤ්ජන භාරතීය සමාජයෙහි පොදු විෂයයක් වූ බැවිනි. බ්‍රාහ්මණයන් අතර ජනප්‍රිය ව පැවැති ෂඩ් ශාස්ත්‍රාද්ධ්‍යනයෙහි ඡන්දස්, නිරුක්ති, ව්‍යාකරණ වැනි ලක්ෂණ පැවැති බව පැහැදිලි කරුණකි. මෙහි එන නිරුක්ති හා ව්‍යාකරණ ගැඹුරින් හදාළ අයකුට අර්ථ හා ව්‍යඤ්ජන රැකගෙන යමක් සන්නිවේදනය කිරීමේ හැකියාවක් පවතී. සාරිපුත්ත, මොග්ගල්ලාන, මහාකච්චායන වැනි තෙරවරු තත් දක්ෂතාවලින් පිරිපුන් භික්ෂූන් වහන්සේලා වශයෙන් සැලැකිය හැකි ය. මජ්ඣිමනිකායෙහි වැඩි ම ශ්‍රාවක භාෂිත ප්‍රමාණයක් අයත් වන්නේ සැරියුත් තෙරුනට ය. ඒ උන් වහන්සේ සන්නිවේදන කාර්යයෙහි ප්‍රමුඛ චරිතයක් ව සිටි බැවිනි. මීට අමතර ව මහාකච්චායන රහතන් වහන්සේ ධර්ම විශ්ලේෂණයෙහි ප්‍රමුඛයා බවට පත් වූ සේක.[3] ඒ උන් වහන්සේ ද බ්‍රාහ්මණ අවධියෙහි නිරුක්ති ශාස්ත්‍රය පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුක්ත ව සිටි බැවිනි. මේ නයින් බලන කල බ්‍රාහ්මණ සමාජයෙන් පැමිණි බොහෝ භික්ෂූන් වහන්සේලා බුදු රජාණන් වහන්සේ අපේක්ෂා කළ භාෂාවේ අර්ථ හා ව්‍යඤ්ජන රැකගෙන ධර්මය දේශනා කිරීමට සමත්කම් දැක්වූ බව ප්‍රකට කරුණකි. තත් සමාජයෙහි බ්‍රාහ්මණ ජාතික භික්ෂූන් වහන්සේලා (සූත්‍රාගත ව එන) පිළිබඳ විස්තර පරීක්ෂා කර බලන විට ඔවුන් සම්පූර්ණ කොට තිබූ ඉතිහාස, පුරාණ, නිඝණ්ඩු, ව්‍යාකරණ වැනි ශාස්ත්‍ර අපට හමු වේ. එමඟින් පැහැදිලි වන්නේ බුදු රජාණන් වහන්සේ පමණක් නො ව සම කාලීන රහතන් වහන්සේලා ද භාෂා ඥානයෙහි කෝවිද වූ බව යි. එය තව දුරටත් පසක් වන්නේ රහතන් වහන්සේ නමක් සිවු පිළිසිඹියා සහිත ව රහත් වීමේ දී උන් වහන්සේලාගේ දක්ෂතා මතු වන අර්ථ, ධර්ම, නිරුක්ති හා පටිභාන යන මේ සියල්ල සන්නිවේදන කාර්යය පදනම් කර පවතින නිසා ය. නිරුක්ති ශාස්ත්‍රයත්, අර්ථය දැනගැනීමත්, එහි ආගමික සන්දර්භය අවබෝධ කරගැනීමත් ප්‍රතිභාන්විත ව නව්‍ය ස්වරූපයකින් නිර්මාණශීලී ව තත් ධර්ම කාරණාව බාහිරට සන්නිවේදනය කිරීමේ

හැකියාවත්, සිවු පිළිසිඹියා සහිත රහතන් වහන්සේගේ ස්වභාවය විය. එනිසා අධ්‍යයන, අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයෙහි ලා භාෂාව, සන්නිවේදනය හා එහි දර්ශනය පිළිබඳ ඉතා විශිෂ්ට ගණයේ මූල ධර්ම ත්‍රිපිටක සාහිත්‍යානුසාරයෙන් මතු කොටගත හැකි බව කිව හැකි ය.

බුදු රජාණන් වහන්සේ අවාච්‍ය වූ අතක්කාවචර වූ, දැකීමට අපහසු වූ, අවබෝධ කරගැනීමට දුෂ්කර වූ[4] තම දැනුම සීමා සහිත භාෂාවක භාවිත කිරීම හේතුවෙන් ඇතැම් පසු කාලීන සම්ප්‍රදාය බුදු දහම සාවද්‍ය ලෙස අර්ථ ගැන්වූ බවට තොරතුරු සොයාගත හැකි ය. සර්වාස්තිවාදයෙහි පදනම එවැන්නකි. පුද්ගලවාදීන්ගේ පදනම ද එවැනි ම කරුණකි. පුද්ගලවාදීහු සංයුත්තනිකායෙහි එන 'භාර' සූත්‍රය පදනම් කරගෙන, නිත්‍ය වූ ස්ථිර වූ පුද්ගලයකු ඇත, ඒ පුද්ගලයා පඤ්චස්කන්ධය උසුලාගෙන සිටින්නේ ය[5] යන මතු පිට අර්ථය රැගෙන වෙනත් සම්ප්‍රදායයක් ගොඩනැගූ හ. එසේ ම බුද්ධ භාෂිතයෙහි අර්ථය මතු පිටින් පමණක් ගෙන සර්වාස්තිවාදීහු ද 'සියල්ල හැම කල්හි ඇත' (සර්වං සර්වදාවාස්ති) යන නිගමනයට එළැඹුණ හ. එනමුත් ඔවුන් හැම අවස්ථාවක ම මඟ හැරගත් කරුණ වන්නේ හැම පදයක ම ව්‍යඤ්ජන හෙවත් ව්‍යඤ්ජනාර්ථයක් පවතින බව යි. තත් දුර්වල අවබෝධය හේතුවෙන් පසු කාලීන ව බෞද්ධ සම්ප්‍රදායවල විවිධ ගැටලු උද්ගත විය.

දාර්ශනික පැහැදිලි කිරීම්වල දී භාෂාව ඉතා වැදගත් උපකරණයකි. එනමුත් එහි අවභාවිතය නිසා දර්ශනයෙහි ඇතැම් මත දෘෂ්ටි ග්‍රහණය විය හැකි බව බුදු රජාණන් වහන්සේ මනා ව දැන සිටි සේක. එනිසා බුදු රජාණන් වහන්සේ තම දේශනාවල ඇතැම් පද භාවිතයේ දී අතිශය කල්පනාකාරී පිළිවෙතක් අනුගමනය කළ අතර නිරන්තරයෙන් ම මධ්‍යස්ථ පද භාවිතයක් උපයෝගී කරගත් බව ද දක්නට තිබේ. "අත්ත" යන වචනය හැකි හැම අවස්ථාවක ම ඉතා සියුම් ලෙස යොදාගැනීමට උන් වහන්සේ උත්සාහ කළේ එහෙයිනි. අනත්ත යන්න තවත් එක් දාර්ශනික ව්‍යවහාරයක් වශයෙන් නො සැලැකූ උන් වහන්සේ එහි දී ද තමා දෘෂ්ටිවාදියකු නො වන බව[6] දීඝනඛ සූත්‍රයේ දී (ම.නි.) පැහැදිලි

කොට ඇත. එබැවින් භාෂාව මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ තවත් එක් ව්‍යවහාරාත්මක උපකරණයක් වූ බව පැහැදිලි ය. මේ තත්ත්වය සුත්තනිපාතයේ පාරායන වග්ගයේ එන තිස්සමෙත්තෙය්‍ය සූත්‍රය විවරණය කරන අංගුත්තරනිකායේ මජ්ඣෙ සූත්‍රයේ භික්ෂූන් වහන්සේලාගේ චර්යාවෙන් පැහැදිලි වේ. මධ්‍යය යනු කවරක් දැ යි විවරණය කරන්නට උත්සාහ කරන භික්ෂූන් වහන්සේලා ස දෙනෙක් ඒ පදය සයාකාරයකට විවරණය කරති. පදයත් පදය හා බැඳුණු අර්ථයත් ඔවුන්ගේ අවබෝධය අනුව විග්‍රහ කළ අතර බුදු රජාණන් වහන්සේ තත් සියලු විග්‍රහ හෙවත් අර්ථකථන අගය කළ හ.[7] එයින් පැහැදිලි වන්නේ භාෂාව හුදු සංකල්පයක් බවත් ඔවුන් ස දෙනාගේ ම අවබෝධය නිවැරැදි බවත් ය. එනමුත් ඔවුනොවුන්ගේ භාෂා භාවිතයේ විවිධත්ත්ව නිසා පද හා සන්නිවේදන ක්‍රම වෙනස් වූ බවත් දක්නට ලැබේ.

භාෂාව චින්තනයේ ඵලයක් ද, නැතහොත් චින්තනය භාෂාවේ ඵලයක් දැ යි යන්න විසඳාගත නො හැකි ගැටලුවකි. දාර්ශනික ගැටලුවක් වන මෙහි යම් පමණකට හෝ පිළිතුරක් සොයාගත හැක්කේ මජ්ඣිමනිකායේ මධුපිණ්ඩික සූත්‍රයේ එන ඥානවිභාග ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමෙනි. "චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සෝ ඵස්ස පච්චයා වේදනා, යං වේදෙති, තං සංජානාති  යං සංජානාති, තං විතක්කේති, යං විතක්කේති, තං පපඤ්චේති."[8] යන ප්‍රකාශයට අදාළ ව ඉන්ද්‍රියානුභූති වන වින්දන විජානනයෙනුත්, විතර්කයෙනුත්, විතර්කයෙන් එළැඹෙන ප්‍රපඤ්ච මඟිනුත් භාෂාවට ගොනු කරයි. තත් භාෂාවට ගොනු කරන ඥානය සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් තවත් අයකුට ශ්‍රැති මාර්ගයෙන් සම්බන්ධ වෙයි. කෙනකුගේ ඥානමය අවබෝධය උපකරණයක් සේ බාහිරට නිකුත් කිරීම තවත් අයකුට ඥානය කුළුගැන්වීම සඳහා උපකරණයක් වෙයි. මෙය භාෂාව හා සන්නිවේදනයෙහි පවතින අන්තර්සම්බන්ධතාව යි. එබැවින් ඉන්ද්‍රියානුභූති ව හෝ අතීන්ද්‍රියානුභූති ව හෝ ලබාගන්නා ඥානය ප්‍රපඤ්චයෙන් කිසි යම් වූ ආකුලතාවක් ඇති ව හෝ නැති ව බාහිරට ඉදිරි පත් කිරීමෙන් පුද්ගලයකු හෝ සමාජයක් සඳහා කිසි යම් අවබෝධයක් ඇති කරගැනීමට රුකුලක් සපයයි. තත් රුකුල අවබෝධ

කරගත් බුදු රජාණන් වහන්සේ සහම්පතී මහා බ්‍රහ්මයාගේ ආරාධනාව පිළිගෙන තමන් අවබෝධ කරගත් ධර්මය දේශනා කිරීම ආරම්භ කළ සේක. එහි දී උන් වහන්සේ යොදාගත් ක්‍රම කිහිපයක් ඉහත දැක්වූයෙමු. ඒ සියල්ල සන්නිවේදන ක්‍රම වන අතර ඒවා සියල්ල එක් ව ගෙන භාෂාව ලෙස හැඳින්විය හැකි ය. ඒ අනුව රූපය ද භාෂාවකි. නිහඬ ව හිඳීම ද භාෂාවකි. උන්වහන්සේ යොදාගත් භාෂා උපක්‍රම සතරක් ප්‍රධාන වශයෙන් දක්නට ලැබේ.

1. ඒකංස ව්‍යාකරණ
2. විභජ්ජ ව්‍යාකරණ
3. පටිපුච්ඡා ව්‍යාකරණ
4. ඨපනීය (අව්‍යාකත)[9]

මෙහි ඨපනීය හෙවත් අව්‍යාකත යනු නිහඬ ව හිඳීම ම නො වේ. තත් නිහඬභාවයේ දී යමක් වක්‍ර ව ප්‍රතික්ෂේප කිරීමක් සිදු වන අතර යමක් සන්නිවේදනය කිරීමක් ද පෙන්නුම් කරයි. දීඝනිකායේ ජාලිය, මහාලි, මජ්ඣිමනිකායේ චූලමාලුඞ්ක්‍යපුත්ත වැනි සූත්‍රවල අර්ථ විරහිත ලෝකය පිළිබඳ විමර්ශන කිරීම් දක්නට ලැබෙන අතර ඒවා බුදු රජාණන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. උන් වහන්සේ ඒවා ප්‍රතික්ෂේප කළේ, බැහැර කිරීම් ස්වරූපයෙන් නො වේ. ඊට හේතුව වන්නේ බැහැර කිරීම් අර්ථයෙන් ඒවා ප්‍රතික්ෂේප කළේ නම් බුදු රජාණන් වහන්සේ ද අන්තගාමී මාවතක ගමන් කළ ශාස්තෘවරයකු වීමට ඉඩ කඩ තිබූ බැවිනි. ආත්මයක් ඇත් දැ යි විමසන යමකුට නැතැ යි ප්‍රකාශ කිරීම අන්තගාමීත්වයකට ඇද වැටීමකි. බුදු රජාණන් වහන්සේ එවැනි ඒකාන්ත ප්‍රශ්න කෙරෙහි දැක්වූ ආකල්පය තරමක් වෙනස් ය. මධ්‍යම ප්‍රතිපදාවේ ගමන් කළ උන් වහන්සේ ඒකාන්ත ගැටලු කෙරෙහි මධ්‍යස්ථ ස්වරූපයක් උසුලමින් අවාචික ව ප්‍රතික්ෂේප කළ සේක. තත් අවාචික ප්‍රතික්ෂේපවල ඇත්තේ නො පිළිගන්නා බව යි. එය ම පිළිතුර වේ. එය ම සන්නිවේදනය යි. එය ම බෞද්ධ ප්‍රතිපදාවෙහි අර්ථ නිරූපණය යි. මේ අයුරින් තුෂ්ණීම්භූතභාවය ද සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් යොදාගත් පළමු වැනි ආගමික ශාස්තෘවරයා බුදු රජාණන් වහන්සේ ය. උන් වහන්සේ හා යම් ප්‍රමාණයකට හෝ සාර්ථක ව සන්නිවේදනය යොදාගත් අන්‍ය ශාස්තෘවරයකු වශයෙන් සැලැකිය හැක්කේ

චතුෂ්කෝටික තර්ක ශාස්ත්‍රය උපයෝගී කරගත් සංජය බෙල්ලට්ඨිපුත්ත පමණි.[10] සංජය බෙල්ලට්ඨිපුත්ත දැඩි ව ප්‍රතික්ෂේප නො කළ යුතු ගැඹුරු දාර්ශනික හරයකින් පිරිපුන් ශාස්තෘවරයකු වූවා නිසැක ය. කෝලිත, උපතිස්ස වැනි විදග්ධ ශිෂ්‍යයන් ඔහු යටතේ අධ්‍යාපනය ලැබුවේ එබැවිනි. සංජය බෙල්ලට්ඨිපුත්ත යොදාගත් සිවු වැනි තර්කය කිසි යම් ප්‍රමාණයකට බුදු රජාණන් වහන්සේගේ තුෂ්ණිම්භූතභාවය හෙවත් අව්‍යාකත ප්‍රශ්න කෙරෙහි දැක්වූ ආකල්පය හා සමානතාවක් උසුලයි. කෙසේ නමුත් මේ කිසි ම පැහැදිලි කිරීමක නිර්වාණය පිළිබඳ වාචික විග්‍රහයක් ඍජු ව දක්නට නොමැත. හැම අවස්ථාවක ම නිර්වාණයට යන මාර්ගය පැහැදිලි කරන බුද්ධ දේශනය නිර්වාණය පිළිබඳ විග්‍රහයකට නො යයි. ඒ තත් අනුභූතිය වචනයට නැඟිය නො හැකි බැවිනි. ඒ එසේ යැ යි පවසා පසෙකින් තැබිය යුතු කරුණක් නො වන අතර ථෙර-ථෙරී ගාථාවල රහතන් වහන්සේලා හා තෙරණින් වහන්සේලා කිසි යම් උත්සාහයකින් තම අත්දැකීම් බාහිරට ප්‍රකාශ කිරීමට උත්සාහ කළ ආකාරය දක්නට වේ. සීතිභූත[11] වැනි පද යොදාගනු ලැබුවේ තත් අරමුණෙනි. ඒවා සියල්ල ව්‍යවහාර ලෝකය හා සම්බන්ධ වුවත් අරමුණු කොට ඇත්තේ නිර්වාණය විග්‍රහ කිරීම යි. අජාත, අමෘත, වැනි පද තිස් දෙකකින්[12] සංයුත්තනිකායේ නිර්වාණය විග්‍රහ කිරීමට උත්සාහ කොට ඇතත් එය සාර්ථක විග්‍රහයක් යැ යි පැවැසිය නො හැකි ය. උදානපාලිය ද මෙවැනි ම උත්සාහයක් දරන අයුරු දක්නට ලැබේ. කෙසේ නමුත් බුද්ධ භාෂිතය අධ්‍යයනය කිරීමෙන් නිර්වාණය කෙබඳු ද යන්න අවබෝධ කොටගත නො හැකි නමුත් නිර්වාණය ලද පුද්ගලයාගේ ස්වභාවය හඳුනාගැනීමේ හැකියාවක් ඇත. සියල්ල භාෂාව ප්‍රාමාණික වශයෙන් යොදාගැනීමේ නො හැකියාව පිළිබිඹු කරන බව පැහැදිලි ය.

බුදු රජාණන් වහන්සේ සූත්‍ර දේශනාවල භාවිත කළ භාෂා භාවිතය විග්‍රහ කරන නෙත්තිප්‍රකරණ කතුවරයා එය අවස්ථා හයකින් ක්‍රමික ව විග්‍රහ කරයි. අක්ඛර හෙවත් අකුරුවලින් ආරම්භ කරන ඔහු ව්‍යඤ්ජන දක්වා ව්‍යාප්ත කරන මේ සංකල්පය නෙත්තිප්‍රකරණයෙහි කිසි යම් සාධාරණයකට ලක් කර ඇති බවත් දක්නට වේ. කෙසේ නමුත් භාෂාව හා සන්නිවේදනය යන

සන්දර්භයෙහි සන්නිවේදනය ධනාත්මක සන්නිවේදනයක් වීම උදෙසා පිරිසුදු, පිළිවෙළ, ක්‍රමානුකූලබව සන්නිවේදන කාර්යයෙහි පැවැතිය යුතු බව බුදු දහම පිළිගනියි. භාෂකයාගේ ඒකාග්‍රතාව හා පැහැදිලි අවබෝධයත් ග්‍රහකයාගේ පිරිසුදු මනසත් පිරිසුදු ඉන්ද්‍රියනුත් සන්නිවේදනය වන මාධ්‍යයෙහි පැහැදිලිතාවත් නූතන සන්නිවේදන මූල ධර්ම හා ඍජු ව ම සම්බන්ධ ය.

උක්ත සන්නිවේදක අවශ්‍යතා බුද්ධ චරිතයෙන් ද විග්‍රහ කොට දැක්විය හැකි ය. මජ්ඣිමනිකායේ බ්‍රහ්මායු සූත්‍රය අනුව බුදු රජාණන් වහන්සේගේ භාෂා භාවිතය පිළිබඳ සන්නිවේදන කෞශල්‍ය විශේෂතා අටකින් විදහා දැක්විය හැකි ය.

1. විස්සට්ඨ (පැහැදිලි)
2. මඤ්ජු (මිහිරි)
3. විඤ්ඤෙය්‍ය (පහසුවෙන් අවබෝධ කරවිය හැකි)
4. සවනීය (නො කඩවා අසා සිටිය හැකි)
5. අවිසාරී (නො විසරුණු)
6. බින්දු (සම්පිණ්ඩිත)
7. ගම්භීර (ගැඹුරු)
8. නින්නාද (ප්‍රතිරාව නඟන)[13]

ඇතැම් විට මේ ශක්‍යතාව ආධ්‍යාත්මික ශක්‍යතාවක් වශයෙන් විග්‍රහ කළ හැකි අතර බුදු රජාණන් වහන්සේ සතු අටාකාර වූ හඬ සුපහන්තාව බ්‍රහ්මායු සූත්‍රයේ දී උදාහරණ සහිත ව විස්තර කොට ඇත. එහි දී උන්වහන්සේගේ හඬ *කුරවීකභාණී*[14] යන්නෙන් කොවුල් හඬකට සමාන කරන අතර බ්‍රහ්මස්වර යනුවෙන් බ්‍රහ්මයාගේ ස්වරය හෙවත් විශිෂ්ටතම ස්වරය යන්න අවධාරණය කරයි. ශ්‍රාවකයන් ඉතා පහසුවෙන් ආකර්ෂණය කරගත හැකි පිරිපුන් හඬ පෞරුෂයක් බුදු රජාණන් වහන්සේ සතු වූ බව තත් ලක්ෂණ විග්‍රහ කිරීමෙන් පැහැදිලි වේ. මේ තත්ත්වය තව දුරටත් පසක් වන්නේ සංයුත්තනිකායේ සගාථවග්ගයේ එන අරුණවතී සූත්‍රයත්, අංගුත්තරනිකායේ තික නිපාතයෙහි එන ආනන්ද වග්ගයෙහි දස වැනි සූත්‍රයත් සම ව ගෙන අධ්‍යයනය කිරීමෙනි. මෙහි පැහැදිලි වන පරිදි අභිභූත නම් වූ සිඛී බුදු රජාණන් වහන්සේගේ ශ්‍රාවකයා

රහතන් වහන්සේ නමක් වූ අතර උන් වහන්සේට චූලනිකා ලෝක ධාතුවේත් එය ඉක්මවාත් හඬ පැතරවීමේ ශක්‍යතාවක් පැවැතිණි.[15] තත් කාරණාව පැහැදිලි කරන අවස්ථාවේ බුදු රජාණන් වහන්සේගේ ශක්‍යතාව කෙබඳු දැ යි පැහැදිලි කරන ආනන්ද තෙරුනට ප්‍රකාශ කොට සිටින්නේ උන් වහන්සේ චූලනිකා ලෝක ධාතුවේ හා එය ඉක්මවාත් මජ්ඣිමනිකා ලෝක ධාතුවේ හා එය ඉක්මවාත් මහාසහස්සී ලෝක ධාතුවේ හා එය ඉක්මවාත් හඬ පැතිරවීමට තරම් ශක්‍යතාවකින් හෙබි බවත් ය.[6] භාෂාවේ පෞරුෂය, ශබ්ද භාවිතයෙහි පෞරුෂය, තත් කාරණයෙන් ම බුද්ධ චරිතයට අදාළ ව තව දුරටත් හඳුනාගැනීමට හැකි ය. සංයුත්තනිකායෙහි මහාවග්ගාගත ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ දී බුදු රජාණන් වහන්සේගේ පළමු වැනි ධර්ම දේශනයෙහි රාවය බ්‍රහ්ම ලෝකය දක්වා ව්‍යාප්ත ව යන ආකාරය ක්‍රමානුකූල ව විග්‍රහ කොට ඇත.[17] මේ සියලු කරුණුවලින් ගම්‍ය වන්නේ පැහැදිලි, පිරිසුදු, තියුණු, ගැඹුරු පෞරුෂේය හඬක් බුදු රජාණන් වහන්සේ සතු ව පැවැති බව යි. නූතන අධ්‍යාපන හා සන්නිවේදන මූල ධර්මවල සාකච්ඡා කෙරෙන භාෂකයා හෙවත් සන්නිවේදනය කරන්නාගේ චරිතය බුදු රජාණන් වහන්සේ සතු ව උපරිමයෙන් පැවැති බව ඊට සාධකයකි.

නිවැරැදි සන්නිවේදනය උදෙසා භාෂාව පමණක් නො ව බාහිර ස්වරූපය ද ඉතා වැදැගත් බව බුද්ධ චරිතය ඇසුරින් ම පැහැදිලි කළ හැකි ය. බුදු රජාණන් වහන්සේගේ සන්නිවේදන කාර්යය උන් වහන්සේගේ රූප කායෙන් ද සිදු වූ අතර තව කෙනකු වෙත කාරුණිකබව, මෛත්‍රී සහගතබව, හෘදයාංගමබව, ප්‍රියමනාපබව, ඇසුරු කළ හැකිබව යන සියල්ල බාහිර රූපයෙන් සන්නිවේදනය විය. බුද්ධ ශ්‍රාවකයකු බවට පත් වූ හැම දෙනා ම පාහේ ප්‍රථමයෙන් බුදු රජාණන් වහන්සේගේ හඬ ගෝචර නො කරගන්නා අතර ප්‍රථමයෙන් ම ඉලක්ක කරගත්තේ උන් වහන්සේගේ රූප කාය යි. රූප කාය කෙරෙහි ප්‍රසාදයට පත් වන ශ්‍රාවකයා නිරායාසයෙන් ම හඬ පෞරුෂය හමුවේ ශ්‍රාවකත්වයට පත් වෙයි. එබැවින් බාහිර ආකෘතිය සන්නිවේදන කාර්යයෙහි ලා ඉතා වැදැගත් මූල ධර්මයක් ලෙස බුදු දහමෙහි පැහැදිලි වේ. ධර්ම දේශනයක දී වුවත් පිරිසුදුබව හා පිරිපුන්බව[18] ඉතා වැදැගත් වන ආකාරය සූත්‍රාශ්‍රයෙන් පෙන්වාදිය

හැකි ය. බුදු රජාණන් වහන්සේගේ ආධ්‍යාත්මික ශක්තිය ද සාර්ථක සන්නිවේදන කාර්යයක් උදෙසා භාෂාව පමණට ම උපකාරී වූ බව අවබෝධ වෙයි. උන් වහන්සේ යම් ආධ්‍යාත්මික ප්‍රාතිහාර්යයක් තම අභ්‍යන්තර තත්ත්වය සන්නිවේදනය කිරීම උදෙසා යොදාගත් සේක. ශාක්‍යයන් හමුවේ ඉදිරි පත් කළ යමාමහ ප්‍රාතිහාර්ය ඉන් එකකි. මීට අමතර ව බිමා හමුවේ ගෙන හැර පෑ රූප මායාවත්, ධම්මපදට්ඨකථාවේ එන භික්ෂුවක් ඉදිරියේ රූපයක් මවා පෑමෙන් කළ අවවාදත් මට්ටකුණ්ඩලී කතා වස්තුවේ දී මට්ඨකුණ්ඩලී ඉදිරියෙහි පහළ වීමෙන් ඇති කළ ප්‍රාසාදයත්[19] බුදු රජාණන් වහන්සේ හා බැඳුණු තවත් විශිෂ්ට සන්නිවේදන ස්වරූපයක් මතු කර දක්වන්නේ ය. මීට අමතර ව උන් වහන්සේ සිරිමා නම් වූ ගණිකාවගේ මෘත දේහය තවත් වැදැගත් සන්නිවේදන උපක්‍රමයක් වශයෙන් උපයෝගී කරගත් බව දක්නට ලැබේ. නිගණ්ඨයන්ගේ කුමන්ත්‍රණයක් වශයෙන් සුන්දරී නම් වූ පරිබ්‍රාජිකාව මරාදමා ඉන් ඇතිවන කෝලාහලය හමුවේ ආනන්ද තෙරුන් වහන්සේ ප්‍රදේශයෙන් බැහැර ව යමු යැ යි යෝජනා කළත් බුදු රජාණන් වහන්සේ ඒ සියලු අවාද ඉවසමින් (තාදි ගුණය විදහා දක්වමින්) නිහඬ ව හිඳීම ද සත්‍ය සන්නිවේදනය කළ එක් අවස්ථාවකි.

ඇතැම් අවස්ථාවල බුදු රජාණන් වහන්සේ ඉතා මෘදු ලෙස සන්නිවේදන කාර්යයෙහි යෙදුණු සේක. සාරාණීය කථා, පටිසාරාණීය කථා, සාමීචි කථාවලින් යුත් උන් වහන්සේ සුහද ලෙස අන්‍යයන් ආමන්ත්‍රණය කළ අතර ඇතැම් අවස්ථාවල අන්‍යාගමිකයන් පවා තත් ආමන්ත්‍රණයෙන් ම ශ්‍රාවකත්වයට පත් වූ ආකාරය උපාලි ආදි සූත්‍රවලින් පැහැදිලි වේ. මීට අමතර ව මජ්ඣිමනිකායේ එන චංකී සූත්‍රයෙහි චංකී වැනි බරපතල බ්‍රාහ්මණත්වයක් ඉසිලූ බමුණන් සමඟ බුදු රජාණන් වහන්සේ ඉතා සුහද පිළිසඳරක යෙදෙන ස්වරූපය[20] අති දක්ෂ ය, ආකර්ෂණීය ය. ඒ උන් වහන්සේගේ සන්නිවේදන කෞශල්‍යය විය. මෘදුභාවය හා සුමුදුබව ඉක්මවා බුදු රජාණන් වහන්සේගෙන් තරමක් රළු සන්නිවේදන ප්‍රතිචාර ද විද්‍යමාන විය. මජ්ඣිමනිකායේ චාතුම සූත්‍රයේ දී උන් වහන්සේ භික්ෂූන් අමතා 'මඤ්ඤෙ මච්ඡවිලොපෙ' යනාදි වශයෙන් මාළු වෙළෙන්දන් මෙන් කෑගසන භික්ෂූන් කැඳවා

රළු ලෙස ආමන්ත්‍රණය කළ ආකාරය පැහැදිලි ය.[21] එවැනි ම තත්ත්වයක් මහාතණ්හා සංඛය සූත්‍රයේ දී හමු වේ. 'මෝඩ පුරුෂය' (මොඝ පුරිස)[22] යන ව්‍යවහාරය යොදාගනිමින් උන් වහන්සේ සන්නිවේදනයේ මුඛ්‍ය අරමුණුවලට පටහැනි සාති භික්ෂුවගේ අර්ථ ශූන්‍ය ප්‍රකාශය ප්‍රතික්ෂේප කළ සේක. එයින් පැහැදිලි වන්නේ බුදු රජාණන් වහන්සේ භාෂාව හා සන්නිවේදනය පුද්ගල දැක්ම හා චර්යාව සංවිධානාත්මක කිරීමෙහි ලා භාවිත කළ බව යි.

කෙසේ නමුත් බුදු රජාණන් වහන්සේ සන්නිවේදනය හුදු ලාලනය පිණිස හෙවත් නැළැවීම පිණිස පමණක් යොදාගත් බව සූත්‍ර සාහිත්‍යයෙන් දක්නට නො ලැබේ. මජ්ඣිමනිකායාගත මහාසුඤ්ඤත සූත්‍රයේ දී 'ආමකෙ ආමකමත්තං භවිස්සාමීති' වශයෙන් දක්වමින් කුඹල්කරුවකු අමු මැටි ආදියෙන් වළං නිෂ්පාදනය කරන්නා සේ තමන් වහන්සේ ද තම ශ්‍රාවකයන් ආරක්ෂා නො කරන බව[23] පවසමින් උන් වහන්සේ ප්‍රකට කරන්නේ කිව යුතු දේ කියන බවත්, නිග්‍රහ කළ යුතු අවස්ථාවේ නිග්‍රහ කරන බවත් අවධාරණය කරමිනි. එබැවින් සන්නිවේදනය හුදු චිත්ත මෝහනය සඳහා හෝ චිත්තාකර්ෂණය සඳහා හෝ බුදු රජාණන් වහන්සේ උපයෝගී කරගත්තේ සත්‍ය පැහැදිලි කිරීමට මිස පිරිස ගොඩනඟාගැනීම සඳහා නො වේ. අධ්‍යාපනයේ දී ද භාෂාව හා සන්නිවේදය උපයෝගී කරගත යුත්තේ හුදු ලාලනය හෝ ප්‍රශංසාව පිණිස නො ව ශ්‍රාවකයාගේ බුද්ධිමය හා භාවමය සංවර්ධනය සඳහා ය.

බුදු දහම සන්නිවේදනයෙහි ඉතා වැදැගත් මූල ධර්මයක් ආරක්ෂා කරන බව ධම්මපදයේ සාහස්සවග්ගයෙන් විවරණය වේ. බහුල ලෙස ප්‍රකාශ කිරීමක් අපේක්ෂා නො කරන බුදු දහම සංක්ෂිප්ත වූ, හරවත් වූ එක් ප්‍රකාශයක් වුවත් ප්‍රමාණවත් කොට සලකයි.[24] බුදු රජාණන් වහන්සේ 'සච්චවාදී' වූ අතර සච්ච සන්ධී ද වූ හ. මජ්ඣිමනිකායේ සුභ සූත්‍රයේ දී බුදු රජාණන් වහන්සේ කෙබඳුවාදී දැ යි විවරණය වේ. උන් වහන්සේ අංගුත්තරනිකායේ ඇතැම් සූත්‍ර අනුව කාලවාදී, භූතවාදී, අත්ථවාදී, ධම්මවාදී, විනයවාදී[25] යන පදවලින් විශේෂණ කොට දක්වා ඇත්තේ තත් සන්නිවේදන කාර්යය ඉලක්ක කරමිනි.

ඉහත සියලු සාධක සමෝධානය කොට එළැඹිය හැකි නිගමනය වන්නේ බුද්ධ චරිතය ලොව සන්නිවේදනය ඇතැඹුලක් සේ දත්, සන්නිවේදනය ඉතා පැහැදිලි ලෙස යොදාගත් පරමාදර්ශී චරිතය වූ බව යි.

බුද්ධ දේශනය ද ඉතා පුළුල් සන්නිවේදන දර්ශනයක් සහිත ව ගොඩනැගුණු දේශනයක් බව පැහැදිලි ය. මජ්ඣිමනිකායේ උපාලි සූත්‍රය අනුව බුද්ධ දේශනාව දානකථා, සීලකථා, සග්ගකථා[26] වශයෙන් ක්‍රමයෙන් ගැඹුරට යන බව පැහැදිලි වේ. ධම්මපදයේ එන ප්‍රකාශයක් අනුව බුදු දහම අනුපූර්වයෙන් අවබෝධ කරගත යුත්තකි.[27] තත් ස්වරූපය අංගුත්තරනිකායේ අට්ඨක නිපාතයේ පහාරාද සූත්‍රයෙන් ද, උදානපාලියේ එන පහාරාද සූත්‍රයෙන් ද පැහැදිලි ලෙස දක්නට ලැබේ. මුහුද යම් සේ 'අනුපුබ්බ පොනො, අනුපුබ්බ නින්නො' වශයෙන් ක්‍රමයෙන් ගැඹුරට යන්නා සේ බුදු දහම ද අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා, අනුපුබ්බ පටිපදා වශයෙන් ක්‍රමානුකූල ව ගැඹුරට යන ඉගැන්වීමකි.[28] එය සන්නිවේදන කාර්යයෙහි ඉතා උසස් ලක්ෂණයක් වන අතර නූතන අධ්‍යාපනඥයන් තත් කරුණු හඳුන්වා දී ඇත්තේ දන්නා දේ සිට නො දන්නා දේ දක්වා යන නියමයෙනි.

ඉතා පැහැදිලි ලෙස නූතන අධ්‍යාපනවේදීන්ගේ නිර්වචනය බුද්ධ භාෂිතයෙන් ද නිරූපණය වනු ප්‍රකට වේ. බුදු දහම හුදු භාෂාව පමණක් යොදාගත් දහමක් හෝ දර්ශනයක් නො වේ. එය ගද්‍ය, පද්‍ය, සාකච්ඡා, ප්‍රහේලිකා වැනි සන්නිවේදන උපක්‍රම භාවිතයෙන් සන්නිවේදන කාර්යය ක්‍රියාවට නැංවූ දර්ශනයකි. ඇතැම් අවස්ථාවල බුදු රජාණන් වහන්සේ තර්කානුකූල ප්‍රකාශ භාවිත කරමින් ශ්‍රාවකයා ගැඹුරින් ඇද බැඳගැනීමට සමත් වන සේක. ශ්‍රාවකයා රඳවාගැනීම උදෙසා ප්‍රතිප්‍රශ්න නගමින් ශ්‍රාවකයා සජීවී ව තමන් කෙරෙහි ආකර්ෂණය කර ගනියි. "කිං රූපං නිච්චං වා අනිච්චං වා? අනිච්චං භන්තෙ, යදනිච්චං තං සුඛං වා දුක්ඛං වා? දුක්ඛං භන්තෙ යං දුක්ඛං තං අත්තං වා අනත්තං වා? අනත්තං භන්තෙ"[29] යනාදි වශයෙන් ප්‍රශ්න කරමින් සාකච්ඡා ස්වරූපයෙන් ශ්‍රාවකයා ග්‍රහණය කොට ධර්මාවබෝධය ලබාදීම උන් වහන්සේගේ පිළිවෙළ විය.

බුදු රජාණන් වහන්සේගේ සුවිශේෂ සන්නිවේදන කෞශල්‍යය ප්‍රථම ධර්ම දේශනාවේ දී පවා මනා ව පැහැදිලි වෙයි. සන්නිවේදනය උපරිම සාර්ථකභාවය සඳහා යොදාගත් උපකරණයක් වූ අතර බුදු රජාණන් වහන්සේ පස් වග මහණුන්හට ධර්මය සන්නිවේදනය කළේ දෙ දෙනකු පිඬු සිඟා යන විට තුන් දෙනකු ඉලක්ක කරමින්, ප්‍රත්‍යෙක වශයෙන් ධර්මය ඉගැන්වීමෙනි. එහෙයින් ප්‍රත්‍යෙක සන්නිවේදන ක්‍රමය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ චරිතයක් ලෙස බුදු රජාණන් වහන්සේ දැක්විය හැකි ය. යළි තුන් දෙනකු පිඬු සිඟා වඩින විට අවශේෂ දෙ දෙනා කෙරෙහි අවධානය යොමු කළ ද කිසි දු අඩුවක් ඌනතාවක් නො දැක්වීම ප්‍රත්‍යෙක සන්නිවේදනයෙහි සුවිශේෂබව යි. ඇතැම් සන්නිවේදන ක්‍රම බුදු රජාණන් වහන්සේ භාෂා ව්‍යවහාරයේ අති දක්ෂයකු බව සංකේතාත්මක ව පෙන්වයි. කෙනකුගේ දුර්වලතාවක් උපහාසාත්මක ව හඟවන ප්‍රකාශ, බමුණන් බ්‍රහ්මයාගේ මුඛයෙන් ඉපැදීම, අග්ගඤ්ඤ සූත්‍රයේ එන වක්‍රෝත්තියක් සේ සැලැකිය හැකි බමුණන්ගේ මවුවරුනට ද කිරි එරෙන බව, දරුවන් ප්‍රසූත කරන බව එවැනි අවස්ථා කිහිපයකි. මේ අසහාය සන්නිවේදන කෞශල්‍යය හේතුවෙන් ම බුදු රජාණන් වහන්සේ මායාකාරී පුද්ගලයකු ලෙස උපාලි සූත්‍රයේ දී තපස්සී නම් වූ නිඝණ්ඨ ශ්‍රාවකයා විසින් හඳුන්වනු ලැබ තිබේ.[30] දීඝතපස්සි උපාලි ගෘහපතියා බුදුන් හමුවට යෑම පිළිබඳ කිසි දු එකඟතාවක් නො වුණේ ගෞතම බුදු රජාණන් වහන්සේ සතු ව ආකර්ෂණීය ශක්‍යතාවක් පවත්නේ ය, යන දැඩි විශ්වාසය හේතුවෙනි . ඒ අන් කිසිවක් නො ව උන් වහන්සේගේ සන්නිවේදන කෞශල්‍යය යි. උන් වහන්සේගේ ධර්ම දේශනා ඇතැම් අවස්ථාවල සංක්ෂිප්ත වූ අතර ඇතැම් අවස්ථාවල අති දීර්ඝ විය. සංයුත්තනිකායේ එන බොහෝ සූත්‍ර "සංඛිත්තේන දෙසිතස්ස අවිභත්තස්ස අත්ථං අජානෙය්‍යාති"[31] යන්නෙන් අවසන් වෙයි. එනම් සංක්ෂිප්ත ව දේශනා කළ මාගේ දේශනය නුඹලාට අර්ථ විග්‍රහ කොට තේරුම්ගැනීමේ හැකියාවක් ඇත් දැ යි යන්න යි. මේ ප්‍රකාශයෙන් අදහස් වන්නේ උන් වහන්සේ බොහෝ විට සංක්ෂිප්ත ව ධර්මය දේශනා කළ බව යි. එනමුත් දීඝනිකායේ එන බොහෝ සූත්‍ර අති දීර්ඝ සූත්‍ර බවට පත් ව තිබේ. ඊට හේතුව වන්නේ බ්‍රාහ්මණයන් වැනි මිථ්‍යා දෘෂ්ටික පුද්ගලයන්ගේ මනෝභාව විශෝධනය කිරීම උදෙසා බුදු රජාණන්

වහන්සේට ඉතා දීර්ඝ ව ධර්මය විග්‍රහ කරදීමේ අවශ්‍යතාවක් පැවැති බැවිනි. තත් කරුණු විග්‍රහ කිරීමෙන් පැහැදිලි වන්නේ අවශ්‍ය තැන විශ්ලේෂණාත්මක ව විස්තර සහිතවත් අවශ්‍ය තැන සංක්ෂිප්තවත් බුදු රජාණන් වහන්සේ ධර්මය දේශනා කළ බව යි. උන් වහන්සේ ම උද්දේසයනට නිද්දේසයන් සැපැයීම අර්ථකථන ස්වරූපයක් අනුගමනය කළ බව ඔප්පු කළ හැකි සාධකයකි.

මීට අමතර ව බුදු රජාණන් වහන්සේගේ ඉතා වැදැගත් ම සන්නිවේදන ස්වරූපය වූයේ විප්ලවවාදී අදහස් සමාජ පරිණාමය උදෙසා ප්‍රතිගාමී ලෙස (Radically) උපයෝගී නො කොට, ඉතා සියුම් ලෙස උපයෝගී කරගැනීම යි. ඉන් එක් කරුණක් වන්නේ බ්‍රහ්ම සංකල්පය යි. බ්‍රහ්ම සංකල්පය ප්‍රතික්ෂේප නො කළ බුදු රජාණන් වහන්සේ බ්‍රහ්ම යන්න 'බ්‍රහ්මාති මාතාපිතරෝ'[32] යන්නෙනුත් බ්‍රහ්ම සංකල්පය 'යමෙක් පව් බැහැර කරන්නේ ද ඔහු බ්‍රහ්මයෙකි' යනුවෙනුත් සංවිධානාත්මක ව වෙනස් අර්ථකථන ඉදිරි පත් කරමින් සන්නිවේදනය කළ හ. එය සන්නිවේදකයකු සතු විය යුතු ඉතා වැදැගත් ලක්ෂණයකි. එනම්, නව සමාජයකට නව සංකල්ප සපයාදීමේ දී සමාජයට අනුගත ව සංකල්ප හඳුන්වාදීම යි. චීනයේ බුදු දහම ව්‍යාප්ත කිරීමේ දී කොන්ෆියුසියස් දහම අනුගත ව ව්‍යාප්ත කිරීමත්, ජපානයේ බුදු දහම ව්‍යාප්ත කිරීමේ දී සින්තෝ ආගම අනුගත ව ව්‍යාප්ත කිරීමත් සාර්ථක විය. ශ්‍රී ලංකාවට ද බුදු දහම හඳුන්වාදීමේ දී මිහිඳු හිමියෝ ලංකාවේ පැවැති ඇතැම් චාරිත්‍ර වාරිත්‍ර හා ඇදහිලි, විශ්වාස අනුව බුද දහම විග්‍රහ කරන්නට යෙදුණ හ. තත් සියලු සාධක හා සමාන ව බුදු රජාණන් වහන්සේ සම කාලීන ව බ්‍රාහ්මණ සමාජයෙන් දායාද වූ ඇතැම් සංකල්ප ප්‍රතික්ෂේප නො කොට ඒවා තමන්ගේ අනන්‍යතාව සහිත ව විග්‍රහ කිරීමට උත්සාහ ගත් සේක. දෙ වැන්න වශයෙන් දැක්විය හැක්කේ බ්‍රාහ්මණ සංකල්පය යි. 'බ්‍රාහ්මණ' යන්න ප්‍රතික්ෂේප නො කළ උන් වහන්සේ බ්‍රාහ්මණයාගේ ස්වරූපය වෙනස් කළ හ. බුදු රජාණන් වහන්සේ හැඳින්වීම සඳහා ද බ්‍රාහ්මණ වචනය යොදාගත් බව වම්මික සූත්‍රයෙන් පැහැදිලි වෙයි. ඇතැම් අවස්ථාවල රහතන් වහන්සේට ද බ්‍රාහ්මණ යන්න යොදාගත් ආකාරය ආසිවිසෝපම සූත්‍රය අනුව පැහැදිලි වෙයි. තවත් අවස්ථාවක ආචාර විද්‍යාත්මක ව බුදු දහමෙහි බ්‍රාහ්මණ

ව්‍යවහාරය භාවිත වූ බව "න ජච්චා වසලො හොති න ජච්චා හොති බ්‍රාහ්මණො"[33] යන්නෙන් පැහැදිලි වේ. මේ ආකාරයෙන් ඛත්තිය, වෙස්ස, ශුද්‍ර, භික්ඛු වැනි පද ඉතා සියුම් ලෙස බෞද්ධ අනන්‍යතාව සහිත ව සන්නිවේදනය කිරීමෙන් බුදු රජාණන් වහන්සේ සම කාලීන සමාජයෙහි පැවැති සංකල්ප බෞද්ධකරණය කළ අයුරු ඉතා හොඳින් පැහැදිලි ය. එය දක්ෂ සන්නිවේදකයකුගේ උපක්‍රමශීලීභාවය යි. සුත්තනිපාතයේ සභිය සූත්‍රය අනුව බුදු රජාණන් වහන්සේ ව්‍යඤ්ජනාර්ථ (Conatation) තම දේශනාවල උපයුක්ත කරගත් ආකාරය පැහැදිලි ය. ඒ අනුව සභිය අරඹයා පණ්ඩිත, මුණි, බ්‍රාහ්මණ[34] වැනි පොදු සංකල්ප බෞද්ධකරණයට ලක් කරමින් විග්‍රහ කළ ආකාරය ඉතා අගනේ ය. බුදු රජාණන් වහන්සේ මේ ආකාරයෙන් සංවිධානාත්මක ව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් භාෂාව භාවිත කිරීමෙන් ඉතා ශීඝ්‍රයෙන් ධර්මය සමාජගත කිරීමට සමත් වූ සේක.

බුදු රජාණන් වහන්සේගේ සන්නිවේදනයෙහි තවත් විග්‍රහ කළ යුතු පැතිකඩක් වන්නේ සමාජ සම්මුතියෙහි රැඳෙමින් උපමා හා රූපක යොදාගෙන ඉතා සරල ව හා සුගම ව නව සංකල්ප සමාජගත කිරීම යි. උන්වහන්සේ ජන සමාජයට ඉතා සමීප සිදුවීම් හා පරිසරය තම අදහස පැහැදිලි කරදීම සඳහා යොදාගත් සේක. සුත්තනිපාතයේ කසීභාරද්වාජ සූත්‍රයේ එන "සද්ධාබීජං තපොවුට්ඨී පඤ්ඤා මෙ යුග නඞගලා"[35] යන ගාථාව එහි එක් පියවරකි. මීට අමතර ව "යථාපි බමරො පුප්ඵං - වණ්ණගන්ධං අහෙඨයං, එලෙති රසමාදාය"[36] වැනි ගාථාවලින් ගම්‍යවන්නා වූ උපමා එදිනෙදා ජීවිතයෙහි දක්නට ලැබෙන සරල සාමාන්‍ය උපමා ය. මහාගෝපාලක සූත්‍රයේ දී ගොපල්ලකුගේ ජීවන චර්යාව ඇසුරු කරමින් ගව රැළක් පාලනය කරන්නේ යම් සේ ද,[37] යනාදි උපමා භාවිත කොටගැනීම සාමාන්‍ය සමාජය හා ජීවත් වූ බුදු රජාණන් වහන්සේ තත් සමාජය ම ඉලක්ක කරමින් තම අනුභූති හා අත්දැකීම් සන්නිවේදනය කළ ආකාරයේ අපූර්වජනක බව ප්‍රකට කරයි. උපමා කෞශල්‍යයෙහි අනූන බුදු රජාණන් වහන්සේ තරම් උපමාවෙහි දක්ෂ වූ කිසිවකු කිසි දු කාව්‍ය සම්ප්‍රදායයක දක්නට නො ලැබෙන බව පැහැදිලි සත්‍යයකි. උන් වහන්සේ උපමාවෙහි පමණක් නො ව රූපක උපයෝගීතාවෙහි ද දක්ෂභාවයට පත් වූ දේශකයෙකි. කසීභාරද්වාජ

සූත්‍රයෙහි එන 'සද්ධාබීජං තපොවුට්ඨි'[38] ආදි අවස්ථා ඊට කදිම නිදසුන් වේ. ගැඹුරු දාර්ශනික විග්‍රහවල දී, නිදසුන් වශයෙන් විඤ්ඤාණයෙහි පැවැත්ම හා ගමන විග්‍රහ කිරීමට ගිය සාති භික්ෂුව අන්තගාමී විග්‍රහයන් ඉදිරි පත් කළ නමුත් බුදු රජාණන් වහන්සේ පඤ්චභයභේරව සූත්‍රයේ දී වඳුරකුගේ ගමන් මාර්ගය උපයෝගී කරගනිමින් වඳුරකු අත්තෙන් අත්තට පනින්නා මෙන් විඤ්ඤාණය භවයෙන් භවයට සැරිසරන ආකාරය[39] පැහැදිලි කළ සේක. මෙවැනි උපමා සාමාන්‍ය පරිසරයේ එදිනෙදා දක්නට ලැබුණු අතර ඒවා අමුතුවෙන් නිර්මාණය කළ බව හෝ කෘත්‍රිම බව නො දිස්වෙන උපමා ය. මෙය සාර්ථක සන්නිවේදකයකු සතු වූ කෞශල්‍යයකි. උන් වහන්සේ යොදාගත් තවත් වැදැගත් සන්නිවේදන උපක්‍රමයක් වන්නේ පරිකල්පනයට වඩා අනුභූතිය විග්‍රහ කිරීම යි. අරියපරියේසන සූත්‍රය, මහාසිහනාද සූත්‍රය, චූල සිහනාද සූත්‍රය, මහාසච්චක සූත්‍රය වැනි සූත්‍රවල දී තම අනුභූති පැහැදිලි කරමින් උන් වහන්සේ අවවාද උවදෙස් ලබාදුන් ආකාරය ඉතා අපූරු ය. එමෙන් ම ඒවා සර්ව කාලීන අගයකින් ද යුක්ත ය.

සම කාලීන සමාජයේ විවිධ පුද්ගලයන් ඇසුරු කරමින් තර්කානුකූල ව අදහස් විග්‍රහ කොට දැක්වීම උන් වහන්සේගේ දේශනාවල පවතින විශේෂ ලක්ෂණය යි. මීට අමතර ව ආඛ්‍යාන යොදාගනිමින් සන්නිවේදන කාර්යයෙහි නියැළීම ද විශේෂ ලක්ෂණයක් වශයෙන් පෙන්වා දිය හැකි ය. දීඝනිකායාගත ඇතැම් සූත්‍රවල ඓතිහාසික ආඛ්‍යාන යොදාගත් අවස්ථා දක්නට ලැබේ. අග්ගඤ්ඤ සූත්‍රයේ එන පුරාණ ආඛ්‍යානයත් අම්බට්ඨ සූත්‍රයේ එන ඓතිහාසික තොරතුරුත් බුදු රජාණන් වහන්සේ ඉතා උචිත ආකාරයට උචිත ස්ථානයක දී යොදාගත් සාධක බව පැහැදිලි වේ. මෙවැනි ඓතිහාසික කථා වස්තු, සත්‍ය සිදුවීම් හා තම ජීවන චරිතය ආදි ආඛ්‍යාන ස්වරූපී කාරණා ද දාර්ශනික කරුණු විග්‍රහ කරගැනීමේ දී බුදු රජාණන් වහන්සේ යොදාගත් තවත් එක් වැදැගත් සන්නිවේදන උපක්‍රමයක් වශයෙන් දැක්විය හැකි ය. කෙසේ වෙතත් භාෂාව ග්‍රහණය සඳහා නො විය යුතු බව බෞද්ධ ස්ථාවරය යි. අරණ විභංග සූත්‍රය[40] ඇතුළු සූත්‍ර ගණනාවකින් ඒ බව අවධාරණය කෙරේ.

උක්ත කරුණු සලකා බැලීමේ දී බුද්ධ චරිතයේත්, උන් වහන්සේගේ දේශනාවලත් විවිධාකාරයේ භාෂා උපක්‍රම, සන්නිවේදන උපක්‍රම, සංවිධානාත්මක සන්නිවේදන ක්‍රම, උපක්‍රමශීලී සන්නිවේදන ක්‍රම, අනුකරණාත්මක සන්නිවේදන ක්‍රම හා නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රම ව්‍යවහාර වූ ආකාරය පැහැදිලි කරගත හැකි ය. නූතන සන්නිවේදන ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටලුව වන්නේ අරමුණ අපැහැදිලි වීම යි. ලෞකික අරමුණු සන්නිවේදනය කිරීම සඳහා ලෞකික භාෂාව ප්‍රමාණවත් වන අතර පාර ලෞකික ආධ්‍යාත්මික කාරණා පැහැදිලි කිරීමේ දී ලෞකික භාෂාව ප්‍රාමාණවත් නො වන බව අවබෝධ විය යුතු ය. එබැවින් ආධ්‍යාත්මික, අලෞකික විෂය ක්ෂේත්‍රයක් විග්‍රහ කරදීමට ලෞකික භාෂාවක් යොදාගත් බුදු රජාණන් වහන්සේ ඇතුළු බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන් ඉතා සියුම් ලෙස දෘෂ්ටි ග්‍රහණයෙන් තොර ව භාෂාව හැසිරවූ ආකාරය විස්මයජනක ය. තත් සියලු භාෂා හා සන්නිවේදන උපක්‍රම නූතන අධ්‍යාපන අධ්‍යයන ක්ෂේත්‍රයේ එලෝත්පාදනය උදෙසා උපයෝගී කරගන්නේ නම් ලෞකිකත්වයෙන් මතුවන ගැටලුවලට පිළියම් ද යොදමින් නිරවුල් මෙන් ම විධිමත් අධ්‍යාපන ක්‍රමයක් හා සන්නිවේදන ක්‍රමයක් සකසාගැනීමට එය මහෝපකාරී වන බව නො කිව මනා ය.

## ආන්තික සටහන්

1 මජ්ඣිමනිකාය i, අරියපරියේසන සූත්‍රය, පිටුව 410
2 සාත්ථං සබ්‍යඤ්ජනං, මජ්ඣිම නිකාය i, අරියපරියේසන සූත්‍රය, පිටුව 421
3 අංගුත්තරනිකාය ඒතදග්ගපාලිය, පිටුව 46
4 මජ්ඣිමනිකාය i, අරියපරියේසන සූත්‍රය, පිටුව 408
5 සංයුත්තනිකාය iii, භාර සූත්‍රය, පිටුව 46
6 අඤ්ඤං ච දිට්ඨිං න උපාදියති, මජ්ඣිමනිකාය ii, දීඝනඛ සූත්‍රය, පිටුව 280
7 සබ්බේසං වො භික්ඛවෙ සුභාසිතං, අංගුත්තරනිකාය iv, මජ්ඣිමනිකාය, පිටුව 188
8 මජ්ඣිමනිකාය i, මධුපිණ්ඩික සූත්‍රය, පිටුව 280
9 එකංස බ්‍යාකරණීයං පඤ්හං එකංසෙන බ්‍යාකරොති, විභජ්ජබ්‍යාකරණීයං පඤ්හං විභජ්ජ බ්‍යාකරොත, පටිපුච්ඡාබ්‍යාකරණීයං පඤ්හං පටිපුච්ඡා බ්‍යාකරොත, ඨපනීයං පඤ්හං ඨපෙත, අං නි, තික නිපාතය, කථාවත්ථු සූත්‍රය, පිටුව 352
10 දීඝනිකාය, බ්‍රහ්මජාල සූත්‍රය, පිටු 45-49

21 ථෙරගාථාපාළි, පිටුව 34
32 සංයුත්තනිකාය IV, 640 පිටුව සිට
43 මජ්ඣිමනිකාය ii, බ්‍රහ්මායු සූත්‍රය, පිටුව 582
54 බ්‍රහ්මස්සරෝ ඛෝ පන භවං ගෝතමො, කරවීකභාණී, එම
65 සංයුත්තනිකාය i, අරුණවතී සූත්‍රය, පිටුව 280
76 අංගත්තරනිකාය, ආනන්ද වග්ගය, 10 සූත්‍රය
87 සංයුත්තනිකාය v (ii), ධම්මචක්කපවත්තන සූත්‍රය, පිටුව 274
98 සංයුත්තනිකාය iv, ධම්මකථික සූත්‍රය, පිටුව 280
109 මට්ඨකුණ්ඩලී කථාවස්තුව
20 මජ්ඣිමනිකාය ii, චංකී සූත්‍රය, පිටුව 659
21 මජ්ඣිමනිකාය ii, චාතුම සූත්‍රය, පිටුව 206
22 මහාතණ්හාසංඛය සූත්‍රය i, පිටුව 602
23 මජ්ඣිමනිකාය iii, මහාසුඤ්ඤත සූත්‍රය, පිටුව 516
24 සහස්සම්පි චෙ වාචා අනත්ථපද සංහිතා ඒකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති, ධම්මපදය, සහස්ස වග්ගය, 1 ගාථාව
25 මජ්ඣිමනිකාය 1, චූල්ලහත්ථිපදෝපම සූත්‍රය, පිටුව 436
26 මජ්ඣිමනිකාය ii, උපාලි සූත්‍රය, පිටුව 74
27 අනුපුබ්බේන මේධාවී ථෝක ථෝකං ඛනේ ඛනෙ, ධම්මපදය 18 -5
28 අංගුත්තරනිකාය v, අට්ඨක නිපාතය පහාරාද සූත්‍රය, පිටුව 82
29 ම.නි. I, 344 පිට
30 මජ්ඣිමනිකාය ii, ගහපති වග්ගය, උපාලි සූත්‍රය, පිටුව 62
31 සංයුක්තනිකාය II, සුසීම සූත්‍රය, පිටුව 192
32 අංගුත්තරනිකාය i, තික නිපාතය,පිටුව 244
33 ඛුද්දකනිකාය, සුත්ත නිපාතය, වසල සූත්‍රය, පිටුව 42
34 සුත්තනිපාත, සභිය සූත්‍රය, පිටුව 164
35 සුත්තනිපාත, පිටුව 24
36 ධම්මපදය, පුප්ඵ වග්ගය, 6 ගාථාව
37 අංගුත්තරනිකාය vi, ගෝපාලක සූත්‍රය, පිටුව 652
38 සුත්තනිපාතය, කසීභාරද්වාජ සූත්‍රය, පිටුව 24
39 සංයුක්තනිකාය II, අස්සුතවන්තු සූත්‍රය, පිටුව 148
40 මජ්ඣිමනිකාය iii, පිටුව 490

## මූලාශ්‍රය නාමාවලිය

**අංගුත්තරනිකාය** i, තික නිපාතය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.
**අංගුත්තරනිකාය** iv, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.
**අංගුත්තරනිකාය** v, අට්ඨක නිපාතය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.
**අංගුත්තරනිකාය** vi, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.
**ඛුද්දකනිකාය**, ධම්මපදය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.